# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 73 — 1973 අගෝස්තු 17 වැනි සිකුරාද — 1973.08.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්



| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1057 | ආණ්ඩුවේ තොවන දැන්වීම ... ... ... | — |
| නිරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| කොවුපල් ඡේන්ද හා වෙනත් ඡේන්ද විකිණීම... ... | — | විවිධ දැන්වීම ... ... ... | — |



පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික (සංශෝධන) පනත් කෙටුම් පත, ණය සහනදායක (සංශෝධන) පනත් කෙටුම් පත, සහ දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම් පත, 1973 අගෝස්තු මස 10 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

### ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

වාණිජ වාහනවල විදුලි රඳන (බැටරි) සැපයීම සඳහා දේශීය සපයන්නන් විසින් (සීල් තබා) මුද්‍රා සහිතව එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයෙහි වූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩල සභාපති මහතා විසින් 1973. සැප්තැම්බර් මස 05 වෙනි දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත ෆෝර්මවල ලියා අනු පිටපතකින්ද යුක්තව එවිය යුතුය. එම ෆෝර්ම මාගේ කාර්යාලයයෙන් 1973.09.04 වැනි දින ප. ව. 3.00 තෙක් තුරු ලබාගත හැක. වේරහැර පිහිටි ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන ගිණුම් නිලධාරි (පිරිවැය) තැන වෙත මුදලින් රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට ෆෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක්ද තැන්පත් කළ යුතුය. එය ආපසු ගෙවනු නොලැබේ.

වැඩි විස්තර සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී මගේ කාර්යාලයෙන් දැනගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,<br>
ලංකා ගමනාගමන මණ්ඩලය.

සම්පාදක කොට්ඨාශය,<br>
වේරහැර, බොරලැස්ගමුව.

8–769—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 සැප්තැම්බර් මස 07 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා පාවිච්චි කළ නොහැකි මෙහි පහත දැක්වෙන බඩු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

1. "හන්ස්ලට්" වර්ගයේ දුම්රිය ඉන්ජින් දෙකකි
2. "කැටර්පිලර්" බුල් ඩෝසර් ඩී7 එකකි
3. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර එකයි
4. වයිබ්රේටස් 12යි. (එක්ස්ටර්නල් ඇලන් වර්ගය)
5. වයිබ්රේටස් 8යි. (ඉන්ගර් සොයිල් රන්ඩ් වර්ගය)
6. අයි. සී. 2780 (සිපිසී 1851) දරණ ඩම්ප් රථය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**<br>
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**<br>
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**

7. සී. අයි. ක්‍රෂර් ජෝස් 45 යි
8. චේන් බොලොක්ක 12 යි
9. කේබල්ස් (ටොන් 2 ක් පමණ)
10. මැෂිං බ්ලේඩ් සහ කියත් මුවහත එකක්
11. බැලැන්සිං සහ ටෙස්ටින් උපකරණ 2 ක්
12. ස්ටාටර් මෝටර් හවුසින් 37 යි
13. ආමචර් සමග ස්ටාටර් මෝටර් 10 යි
14. ඩයිනමෝ ආමචර් 79 යි
15. ස්ටාටර් ආමචර් 46 යි
16. ඉලෙක්ට්‍රික් වතුර පොම්ප 8 යි
17. ඉලෙක්ට්‍රික් මෝටර් 2 යි.
18. ස්ලිප් රින්ග් රෝටර් 1 යි
19. ඔටුලෝම පටි 44 යි
20. රේඩියේටරය ඇති ඩීසල් ඇන්ජින් 1 යි
21. පස හාරා ගැනීමට පාවිච්චි කරන යන්ත්‍ර 1 යි
22. හයිඩ්‍රෑෂර් කටර් 1 යි
23. ඉජෙක්ටරයක් ඇති එයාර් පොම්ප 1 යි
24. ලෝකෝ පල්සර් 1 යි
25. අශ්වබල 1,100 විෂ්කම්භය අඟල් 14 ඉලෙක්ට්‍රික් පම්පින් සෙට් 1 යි

මෙම විෂයයන් ප්‍රමාණ පත්‍රයෙහි දැක්වෙන ස්ථානයන්හිදී පරීක්ෂා කළ හැක.

1973 සැප්තැම්බර් මස 07 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර්, දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කායාීලයේදී පරීක්ෂා කළ හැක. රු. 250 ක මුදලක් වරාය කොමිෂන් සභා කායාීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝරම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1973 සැප්තැම්බර් මස 05 වෙනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

ඇස්. ඇම්. බී. දොලපිහිල්ල,
වැඩ බලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව.
කොළඹ 1,
1973 අගෝස්තු 17 දින.

8–695—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 සැප්තැම්බර් මස 11 වෙනිදා පස්වරු 2.30 දක්වා පහත දැක්වෙන පාවිච්චි කළ නොහැකි වූ බඩු විකිණීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

1. යතුරු ලියන 12 යි.
2. එකතු කරන යන්ත්‍ර 6 යි.
3. බයිසිකල් 2 යි.
4. ඉලෙක්ට්‍රික් කේතල 1 යි.
5. ජොග්ගු 12 යි.
6. හිස් ටින් (සබන්) 40 යි.
7. ගැලුම් 45 හිස් තෙල් බැරල් 150 යි.
8. ගැලුම් 45 හිස් තෙල් බැරල් 150 යි.
9. ගැලුම් 45 හිස් තෙල් බැරල් 100 යි.

මෙම විෂයයන් ප්‍රමාණ පත්‍රයෙහි දැක්වෙන ස්ථානයන්හිදී පරීක්ෂා කර බැලිය හැක.

1973 සැප්තැම්බර් මස 11 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එයි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කායාීලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කායාීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1973 සැප්තැම්බර් මස 08 වෙනි දින පෙ. ව. 11 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇස්. ඇම්. බී. දොලපිහිල්ල,
වැඩ බලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1,
1973 අගෝස්තු 17.

8–696—73. 08. 17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

#### කළුතර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

පහත සඳහන් වැඩය සඳහා රු. 30,000 කට නොඅඩු මුදලකට හෝ ඊට වැඩි තැනීම් වැඩ වෙනුවෙන් රජයේ වැඩ, අධ්‍යාපන හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ සහ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

#### වැඩ විස්තරය

වලල්ලාවිට ලේදොල, ගල්වික හරහා ගුහැනිය පාර තැනීම.

(2) මේ සඳහා ටෙන්ඩර් පත්‍ර පිටපත් 2 කින් යුක්තව පිළියෙල කොට සීල් තබා කොළඹ, තැපැල් පෙට්ටිය අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ නමට එවිය යුතුය.

(3) ටෙන්ඩර් ශාලා මුවදොර, මහලේකම් කායාීලයේ, 3 වැනි තට්ටුවේ, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය, නොඑසේ නම්, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

(4) ටෙන්ඩර් පත්‍ර බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරේ වැඩයේ නම ලියා, 73.09.03 වැනි දින පස්වරු 1 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන වෙත ලැබෙන සේ එවිය යුතුය. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. ටෙන්ඩර් කරුවන්ටද එම වේලාවේදී පැමිණ සිටිය හැකිය.

(5) 1973 අගෝස්තු 31 වැනි දින දවල් 2 දක්වා කළුතර දිසාපති කායාීලයේ ඉඩම් අංශයේදී ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය. නියමිත පෝර්මයේ ඉදිරිපත් නොකරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(6) ටෙන්ඩර්කරු විසින් එවනු ලබන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලබන මැකීම්, කපාගැම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානය කම ඔහුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

(7) ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රු. 20 ක් කළුතර, දිසාපති කායාීලයේ තැන්පත් කර, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් ය.

(8) තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

(9) ටෙන්ඩර් පත්‍ර පිළිගත් බවට යැවෙන දැන්වීම් ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයේ තබනු ලැබුවහොත් හෝ එය දැන්වීම ටෙන්ඩර්කරුට ලැබුනාක් මෙන් සළකනු ලැබේ. ගිවිසුම්පත් අත්සන් කිරීමෙන් පසු අනික් සියළුම තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

(10) තෝරා ගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළදී නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5 ක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් ඇනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

(11) ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව, ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ ටෙන්ඩරයේ කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමනින් ම රජය කෙරෙහි පවතින්නේ ය. ටෙන්ඩර් මණ්ඩලයේ අවසර නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කරගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේ ය.

(12) කොන්ත්‍රාත්කරු යටතේ සේවය කරන යම් කිසිවකුගේ සේවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යයි හැඟී යන කරුණු උඩ කළුතර දිසාපති විසින් ලියවිල්ලකින් විරුද්ධත්වයක් දැක්වූ විට කොන්ත්‍රාත්කරු විසින් එවැනි අයගේ සේවය නතර කළ යුතුය.

(13) කොන්ත්‍රාත්කරු සහ ලංකාණ්ඩුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රධාන තැනද මෙම කොන්ත්‍රාත්තුවට අත්සන් කළ යුතුය. ලංකාණ්ඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්තුවට අත්සන් කරන අයගේ නිල තත්ත්වයට අනුව එවකට සහ ඉන් පසු මෙම නිලයෙහි අත්සන් කරන අයද අයත් වේ.

(14) මෙයට පෙර බාරගන්නා ලද කොන්ත්‍රාත් වැඩ කරගෙන යන අපේක්ෂකයින් කල්වේලා ඇතිව ඔවුන් දැනට කරගෙන යන වැඩ වල තත්ත්වය දැක්වෙන එම වැඩ භාරව සිටින පරිපාලක නිලධාරීන් ගෙන් ලබාගන්නා ලද සහතික පත්‍ර ටෙන්ඩර් ඇප මුදල් තැන්පත් කොට ලබාගන්නා ලද ලදුපත් සමග කළුතර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(15) යම් ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීමේදී ඇපකරුවන් අවශ්‍ය වුවහොත් තෝරාගත් ටෙන්ඩර්කරු මෙම අවශ්‍යතාවය සපුරාලීමට සමත් විය යුතුය.

(16) රජයේ වැඩ පැහැර හැරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයේ නම ඇතුළත් කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

පී. අයි. ප්‍රනාන්දු,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි, කළුතර දිසාපති වෙනුවට.

1973 අගෝස්තු මස 03 දින,
කළුතර දිසාපති කාර්යාලයේ දීය.

8–684 —73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය**

1974 වර්ෂය තුළ කොස්ටික් සෝඩා සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**ප්‍රමාණය :**

කොස්ටික් සෝඩා (ඝන) මෙට්‍රික් ටොන් 3,400 ක් සහ
කොස්ටික් සෝඩා (කැට) මෙට්‍රික් ටොන් 500 ක්

1973 ඔක්තෝබර් 03 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේ. කාණ්ඩයකට රු. 10 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා වැඩිදුර විස්තර සංයුක්ත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය. මෙම රු. 10 ආපසු ගෙවනු නොලැබේ.

සහකාර සාමාන්‍යාධිකාරී,
පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1489,
29, මෙල්බර්න් මාවත,
කොළඹ 4,
1973 ජූලි 23 දින.
දුරකථන : 85421/2

8-723 —73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ධීවර සංස්ථාව**

ජාඩි පිප්ප නැවත සවිකිරීම

ජාඩි පිප්ප නැවත සවිකිරීම සඳහා ලංකා ධීවර සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.08.27 දින පස්වරු 2.30 දක්වා සිල් තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

රුපියල් 50 ක ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු පහත ආදර්ශ අත්සන් කරන අයගෙන් 1973. 08. 25 දින පෙ. ව. 11 තෙක් ටෙන්ඩර් පත් ලබාගත හැක.

කළමනාකාර සැපයීම් සහ ගබඩා.

රොක්හවුස් පටුමග,
කොළඹ 15,
1973 අගෝස්තු 04.

8-768—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොළඹ 10 (මරදාන) වීරිපොලී වෙළඳහලේ ආරෝග්‍යශාලා සැපයීම් අංශයට 1973. 09. 01 සිට 1973.12.31 න් අවසන් කාලය සඳහා කුකුල්මස් සැපයීමට ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් විදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 අගෝස්තු මස 31 වෙනි දින අ. භා. 2 දක්වා බාරගනු ලැබේ. පහත සඳහන් ලිපිනයෙහි පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළවිට 1973.08.31 වෙනි දින දහවල් 12.0 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පිළිවන.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973. 08. 07 වන දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

8-774 —73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශිය සිවිල් ඉංජිනේරු සංවිධානය—දකුණු දිසාව**

ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් පත්, 1973.09.13 වැනි දින පෙරවරු 10 දක්වා භාරගෙන, එම වේලාව ගත වූ වහාම එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ:—

" බොගමුව වැව අළුත්වැඩියා කිරීම. "

2. රුපියල් 50 000 ට වඩා වැය වන කටයුතු සඳහා රජයේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ රජයේ කිසියම් සංස්ථාවක හෝ මෙම සංවිධානයේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය එසේ ලියාපදිංචි වී ඇති බවට සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත්

කළ යුතුයි. ඔවුන් දැනට කරන මෙම දෙපාර්තමේන්තුවේ වැඩ හා ඒවායේ වටිනාකම පිළිබඳ ප්‍රකාශයක් වීරකැටියේ විධායක ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. 1973.9.7 වැනි දින ප. ව. 2 දක්වා වීරකැටිය විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් විධායක ඉංජිනේරුට ගෙවූ විට හෝ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම කාර්යාලයට හෝ ඕනෑම දිසාපති කාර්යාලයකට ගෙවා ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් යුක්තව, ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ සීල් තබා තිබිය යුතු අතර, වැඩයේ විස්තරය එම කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර තිබිය යුතුය.

5. මෙම වැඩ පිළිබඳ සැලසුම් හා අනිකුත් සියළු තොරතුරු වීරකැටිය විධායක ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

කේ. වෙල්වරාජා,
වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
ගාල්ල,
1973.8.6

8-699—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—උතුරු දිසාව

1973 ජූලි මස 20 වැනි දිනයක් වූ ශ්‍රී ලංකා ගැසට් පත්‍රයෙහි පෙනන ලද "තොන්ඩමනාරු හරස් අමුණට ලී ගේට්ටු දෙකක් සැපයීම සහ සවිකිරීම" යන වැඩ අදාල ටෙන්ඩර් පත්‍ර දෙන අන්තිම දිනය 1973 අගෝස්තු මස 31 වැනි දින තුරු ද, ටෙන්ඩර් සභාපතිතුමා විසින් බාරගන්නා දිනය 1973 සැප්තැම්බර් 4 වැනි දින දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වනු ලැබේ.

ඇස්. තියාගරාජා.
විධායක ඉංජිනේරු තැන,
පේදුරු තුඩුව.

විධායක ඉංජිනේරු කාර්යාලය,
ප්‍රා. සි. ඉ. සං.
පේදුරුතුඩුව.

8-698—73.08.17 දින අංක. 73 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

පිරිපහදු අංශය

**ද්‍රව ඛනිජ තෙල් වායු සේවා ශාල ගොඩනැගීම**

ඉහත සඳහන් කරුණ සඳහා ටෙන්ඩර් පත් බාර ගැනීම 1973. 09. 03 දින ප. ව. 2 තෙක් කල්දමා ඇත.

ජ්‍යෝෂ්ඨ කාර්යාල ඉංජිනේරු.

තෙල් පිරිපහදු අංශය,
තැ. පෙ. 11,
කැලණිය.

8-766—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පහත සඳහන් කාර්යයන් සඳහා රුපියල් 25,000 සහ ඊට වැඩ කොන්ත්‍රාත් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන්, සමූපකාර සමිතිවලින් හා ග්‍රාම සංවර්ධන සමිතිවලින් ඉදිරිපත් කරන ටෙන්ඩර් 1973 සැප්තැම්බර් මස 11 දින පෙරවරු 10 දක්වා ජූලම්පිටිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, මුරුතවෙල ව්‍යාපාරයේ, නිර්මාණ ඉංජිනේරු විසින් භාරගනු ලැබේ :—

"ගාල්ල, රුහුණු සිමෙන්ති කර්මාන්ත ශාලාවේ සිට මුරුතවෙල ව්‍යාපාරයට සිමෙන්ති ප්‍රවාහනය කිරීම"

2. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට ටෙන්ඩර්කරුවන්ට අඩුම ගණනේ ලොරි දෙකක්වත් තිබිය යුතු අතර ඒ බව සනාථ කිරීම සඳහා ලියාපදිංචි සහතිකය සහ 1973 වර්ෂයේ ආදායම් බල පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

3. ජූලම්පිටිය, මුරුතවෙල ව්‍යාපාරයේ, නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. කවර දිසාපති කාර්යාලයක හෝ ජූලම්පිටිය, මුරුතවෙල ව්‍යාපාරයේ, නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973 සැප්තැම්බර් මස 7 වන දින පස්වරු 2.30 දක්වා කාර්යාල වේලාවන් තුළදී ටෙන්ඩර් ආකෘති පත් ලබාගත හැකිය. ටෙන්ඩර් පත් බහා එවන කවරයේ "ගාල්ල, රුහුණු සිමෙන්ති කර්මාන්ත ශාලාවේ සිට මුරුතවෙල ව්‍යාපාරයට සිමෙන්ති ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට, මුද්‍රා තබා, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

4. ජූලම්පිටිය, මුරුතවෙල ව්‍යාපාරයේ, නිර්මාණ ඉංජිනේරු තැනගෙන් වැඩි විස්තර ලබාගත හැකිය.

කේ. කදිරගාමන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉදිකිරීම්),
වාරිමාර්ග අධ්‍යක්ෂක වෙනුවට.

1973 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දී ය.

8-775—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල තිබෙන පහත සඳහන් ලෙලි පොල් තොග විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973 09. 07 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ :—

බතලගොඩ ගොවිපලේ ලෙලි පොල් 50,000 ක් පමණ.
වාරියපොල ගොවිපලේ ලෙලි පොල් 29,000ක් පමණ.

(i) පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුලතදී ගොවිපලේ කළමනාකරුට සම්පූර්ණ පොල් තොගය සඳහා මුළු මුදල එකවර ගෙවා පොල් තොගය භාර ගෙන ගොවිපලින් බැහැර කරගත යුතුය. මොනම හේතුවක් නිසාවත් පොල් තොග මිලදී ගැනීම සඳහා දෙනු ලබන කාලය නැවත දීර්ඝ කරනු නොලැබේ.

(ii) පොල් තොගය භාර ගැනීමේදී කිසිම පිළිවෙලකට වර්ග කිරීම කට ඉඩ නැත. එමෙන්ම පුහුවූ හෝ කුණුවූ හෝ කුඩාවූ හෝ වශයෙන් වර්ග කිරීමටද ඉඩ නැත.

2. පේරාදෙණියේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්) කාර්යාලයෙන් ලබාගන්නා ලද ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි බතලගොඩ/වාරියපොල රජයේ ගොවිපලේ ලෙලි පොල් මිළයට ගැනීම කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. 1973. 09. 06 වන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. තිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම

හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇත් නම්, මෙකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකි වේ. අනුමත කරනු ලැබූ සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් නිදහස්ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන්ට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනුපිටපතක්ද සමග ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් නො එවන්නේ නම්, ගාලු මුවදොර, පරණ මහ ලේකම් කාර්යාලයේ, අංක 320 දරණ කාමරයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතු වේ.

6. 1973 අගෝස්තු 31 වෙනි සිකුරාදා පස්වරු 2.30ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැකිය.

7. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තු යටතේ, වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟවිය යුතුයි.

8. වැඩි විස්තර රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිගෙන් ලබාගත හැකිය.

ඇස්. සී. මානික්කවාසගර්,
අතිරේක දිසාපති,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 ජූලි මස 31 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

8-697 —73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කය තුල, මාස්මුල්ල ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයට පිවිසෙන පාර තැනීම

ඉහත සඳහන් වැඩ සඳහා රුපියල් පනස් දහස (50,000) කට හෝ ඊට වැඩි වැඩ වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචිව ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් සහ සමූපකාර කම්කරු සමිති, විවිධසේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළු ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සීල් තබා, කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි. නොඑසේ නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙලවරෙහි "මාස්මුල්ල ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයට පිවිසෙන පාර තැනීම සඳහා වූ ටෙන්ඩර්" යයි ලියා 1973. 09. 07 වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන්ට ද එම වේලාවේදී පැමිණ සිටිය හැක.

5. 1973. 09. 04 වැනි දින දවල් 12 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ඉල්ලුම් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලැබූ මැකීම් කටුගැම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 50 ක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කරුයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිත ටෙන්ඩර්කරුට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසුව අනිත් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුල නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචිවූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස් ය.

11. ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

12. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයේ නම් ඇතුළත් කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

පී. ඩබ්. සී. ද සිල්වා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973. 07. 31 දින,
මාතර කච්චේරියේදීය.

8–607—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

යොමුව : පී.ඇස්.ඩී. 1/42/73.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### හයිපොඩමික් සිරින්ජර්ස් සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් හයිපොඩමික් සිරින්ජර්ස් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.:—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස් පාරේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1973.10.23 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින් හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම් වලින්,

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්තානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම්, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1973.8.1.

අදාල උපලේඛනය
SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | All glass Luer Lock Hypodermic Syringes 2 ml graduated ½ ml. and minims | 500 dozens .. | In any convenient packing |
| 2 .. | All glass Luer Lock Hypodermic Syringes 5 ml. graduated 1/5 ml. and minims | 200 dozens .. | do. |
| 3 .. | All glass Luer Lock Hypodermic Syringes 20 ml. graduated 1 ml. | 50 dozens .. | do. |
| 4 .. | All glass Luer Lock Hypodermic Syringes 10 ml. graduated 1/5 ml. and minims | 1,000 dozens .. | do. |
| 5 .. | All glass Luer Lock Hypodermic Syringes 50 ml. with Accentric Nozzle graduated 5 ml. | 200 dozens .. | do. |

8-638—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

යොමුව : පී.ඇස්.ඩී. 1/33/73.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ස්ටෙරලයිසින් ඩ්‍රම්ස් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ස්ටෙරලයිසින් ඩ්‍රම්ස් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ ;—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස් පාරේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.9.25 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ,

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම් වලින්,

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදි රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට

කොළඹ, 1973.8.1

අදාල උපලේඛනය
SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Sterilizing Drums Deep made of heavy gauge copper nickle with doomed top and bottom for strength. Lid fitted with strong hinges with slopes to prevent at felling right back when opened. Perforated sides with airtight closing bags diam. 15 1/4″ depth 11″ thickness 0.64″ weight 8 to 8½ lbs. | 100 only .. | In any convenient packing |
| 2 .. | Sterilizing Drums Deep made of heavy guage copper nickle with doomed top and bottom for strength. Lid fitted with strong hinges with slopes to prevent at felling right back when opened. Shallow diam 15 1/4″ Depth 5½″ thickness 0.064″ weight 8 to 8½ lbs. | 100 only .. | do. |

8-639—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව—හම්බන්තොට කච්චේරිය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙහි පහත දැක්වෙන තැනීම් වැඩ සඳහා 1973.08.31 වැනි දින පස්වරු 2.00 දක්වා හම්බන්තොට දිසාපති තුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| වැඩයේ නම | ලියා පදිංචි විය යුතු මුදල රුපියල් |
| --- | --- |
| හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ මිද්දෙනිය ඉඩම් සංවර්ධන ඕවර්සියර් නිල නිවාසය අළුත්වැඩියා කිරීම ... | ... 4,000 |

2. ඉහත සඳහන් කර ඇති වැඩට ඉදිරියෙන් දක්වා ඇති මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට හා අනුමත කරන ලද සංගම්වලටද, 1973.08.30 දින පස්වරු 2.00 දක්වා හම්බන්තොට දිසාපති විසින් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ලියාපදිංචිය හා අනිකුත් දෑ සනාථ කිරීම සඳහා ලිය කියවිලි ඉදිරිපත් කල යුතුයි.

3. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින් හම්බන්තොට කච්චේරියේ ඉහත දැක්වෙන වැඩය වෙනුවෙන් රු. 10 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතාන්සියක් හම්බන්තොට දිසාපති වෙත ඉදිරිපත් කල විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම් හා තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයත් සමිති වලටද, එම වැඩ සඳහා ඉහත දැක්වෙන මුදල් ප්‍රමාණයන්ට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී තිබේ නම් එකී වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කල හැකියි. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් කරනු ලැබේ. එහෙත් ඉහත වැඩය වෙනුවෙන් දැක්වෙන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් එකී සමිතිවලට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්තව ලේඛණ ගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයා මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් ඉහළ කෙළවරේ වැඩ යෙහි නම ලියා තැබිය යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම තැපෑලෙන් නො එවන්නේ නම්, හම්බන්තොට කච්චේරියේ කාර්යාල සහකාර තැනගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

5. 1973.08.31 දින පස්වරු 2.30 ට ඉහත කී කාමරයේ ටෙන්ඩර් ෆෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලියකියවිල්ලකින් දැන්වූ පසු දින 10 ක් ඇතුලත ගිවිසුම් පත්‍ර අත්සන් කිරීමට හා ඇප මුදල් තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

7. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩකරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයෙන්ම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවාගත යුත්තේ වැඩ කරනු ලබන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ජයග්‍රාහී ටෙන්ඩර්කරුට භාරදෙන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙන යන අතරතුරදී කොටස් මුදල් ලබා ගැනීමට අවශ්‍යවුව හොත් එවැනි අවස්ථාවලදී කරන ලද වැඩවල තක්සේරු කැරුන වටිනාකමින් සියයට 90 කට සරිලන ප්‍රමාණයේ කොටස් මුදල් ලබා ගත හැකියි.

9. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් විස්තර ඇත්නම් හම්බන්තොට දිසාපතිගෙන් විමසීමෙන් ලබාගත හැකියි.

ඩබ්ලිව්. පී. එස්. ජයවර්ධන,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

1973.07.31 වන දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේ දිය.

8-651—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් හම්පටි (දැනට ඇති තොගවලින්) සැපයීම සඳහා 1973.08.30 දින පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. වැඩි විස්තර හා ටෙන්ඩර් කොළ ජේසි කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැක.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය :—3/1—(3/40)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 අගෝස්තු මස 06 වැනි දින.

8-666—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ කොටුවේ ලක්සලෙහි සමිති කාර්යාලයයක් සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණයක් චිප් බෝඩ් සහ පැස්සුණු දැල්වලින් වෙන්කිරීම පිණිස, 1973.9.8 වනදා පෙ. ව. 10 දක්වා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර බාරගනු ලැබේ.

2. රුපියල් 2000 ක් සහ ඊට වැඩි මුදලක් වැයවන ගොඩනැගිලි තැනීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කැරේ.

3. ඉදිරිපත් වීමට බලාපොරොත්තුවෙන් සිටින ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ආකෘතිපත් ලබා ගැනීමට, 1973.09.07 වනදා මධ්‍යාහ්න 12 ට හෝ ඊට පෙර හෝ මේ දෙපාර්තමේන්තු කාර්යාල යෙහි රු. 25 ක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ලියාපදිංචිය පිළිබඳ ලිපින් ඉදිරිපත් කළ යුතුය.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1.—(1/58)
1973.08.06 වන දින,
කොළඹ 1,
හේමාස් ගොඩනැගිල්ලේ,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේදිය.

8-665—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

සටගන්විල කැඳ ඇඹීමේ ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.09.08 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 50,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973. 09. 07 දින මධ්‍යාහ්න 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචි ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව :—3/1—(1/59)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 අගෝස්තු මස 06 වැනි දින.

8-667—73.08.17 දින අංක 73 දරණ ගැසට් පත්‍රය

යොමුව : පී.එස්.සී. 2/9/73

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ගෝස් ඇබ්සෝබන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ගෝස් ඇබ්සෝබන් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්;

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 10, තැ.පෙ. 584, 385, ඩීන්ස් පාර අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 73.10.02 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ :—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්;

(ii) i වැනි ඡේදයේ iv වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

එන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 28 වැනි දින,
කොළඹ.

